විද්‍යාලය : -   ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය:-   12 ශ්‍රේණිය පැවරුම්

සිංහල විෂය භාර ගුරු:-     ඕ.එම්.එන්.කරුණාරත්න

**පුරාතන පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය**

``පෙදෙන් බුදු සිරිතැ       බසින් වත් සිරිත් ඇ

පද යුතු බසින් නළු ඇ   අනතුරු ලකුණු දක්වම්´´

(පද්‍යයෙන් බුදු සිරිතද ගද්‍යයෙන් වත් පිළිවෙත්ද ගද්‍ය

පද්‍ය දෙකේම එකතුවෙන් නට්‍යද රචනා කල යුතු

බව-සියබස්ලකර)

**●ප්‍රශ්නය-:සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පිළිබඳව පැහැදිලි කරන්න ?**

පද්‍ය සාහිත්‍යයේ ආරම්භය

- පද්‍ය සාහිත්‍යයේ ආරම්භය අනුරාධපුර අවධියේදී සිදුවීම(පද්‍යයෙන් රචනා වූ සෙල්ලිපි හා සීගිරි ගී)
- සංස්කෘත සාහිත්‍යයේ ආභාශය ලබා කාව්‍යකරණය පිළිබඳව උපදේශ ග්‍රන්ථයක් වූ සියබස්ලකර අනුරාධපුර අවධියේදී රචනා කිරීම.

පද්‍ය සාහිත්‍යයේ විකාසනය විවිධ සාහිත්‍යය අවධි ඔස්සේ පද්‍ය සාහිත්‍යය වර්ධනය වූ අයුරු හා විශේෂ ලක්ෂණ පිළිබඳ පැහැදිලි කල යුතුය .

- අනුරාධපුර අවධිය :- සියබස්ලකර හා සීගිරි ගී රචනා වීම.
- පොළොන්නරු අවධිය :- ගී විරිත් ඇසුරෙන් ගී කාව්‍ය රචනා වීම (මුවදෙව්දාවත හා සසදාවත )
- දඹදෙණිය අවධිය :- පද්‍යකරණය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම(දෙවන පරාක්‍රමබාහු රජු කව්සිළුමිණ මහා කාව්‍යය රචනා කිරීම)
- ගම්පොළ අවධිය:- ප්‍රථම සංදේශය කාව්‍ය ලෙස මයූර සංදේශය හා තිසර සංදේශය රචනා වීම
- කෝට්ටෙ අවධිය :- විවිධ ආකෘති හා විවිධ ක්‍රම ශිල්ප ඔස්සේ පද්‍ය ග්‍රන්ථ ගණනාවක් රචනා වූ මෙමෙ කාලය පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය කාලය වීම. ( මහා කාව්‍ය සංදේශය කාව්‍ය ,ප්‍රසස්ති කාව්‍ය,කෝෂ කාව්‍ය, උපදේශ කාව්‍ය.....ආදිය)